**e-නැණපියස වැඩ සටහන**

**දියමන්ති ව්‍යාපෘතිය**

**සාමාන්‍ය පාඩම් - 9**


| විෂය | ශ්‍රේණිය | වාරය | පාඩම /ඒකකය |
|---|---|---|---|
| චිත්‍ර කලාව | 10 | II | 7.2.2.මැදවල ටැම්පිට විහාරය |

**ඉගෙනුම් අත්වැල**

**මැදවල ටැම්පිට විහාර**



- ගල් කණු මත ඉදිකළ විහාර ටැම්පිට විහාර ලෙස හඳුන්වයි.
- මෙම විහාරය පිහිටා ඇත්තේ මහනුවරට නුදුරු මැදවල නම් ග්‍රාමයේ ය.
- මැදවල ටැම්පිට විහාරය අඩි 01 යි අඟල් 08 ක් උස් වූ ගල් කණු 34 ක් මත ඉදිකර ඇත.
- මැද මහනුවර සම්ප්‍රදායට අයත් ඉතා සියුම් හා විශිෂ්ට නිමාවන්ගෙන් යුත් චිත්‍ර ගණනාවක් මෙම විහාරයේ දැකිය හැකි ය.
- මැදවල විහාරය තුළ දක්නට ලැබෙන කුඩා තීරු සංරචන සිතුවම් අතර ජාතක කතා, සත්සතිය වැනි මාතෘකා වැදගත් වේ.
- ජාතක කතා අතර වෙස්සන්තර ජාතකය හා උරග ජාතකය ප්‍රධාන තැනක් ගනී.
- මැදවල විහාරයේ සිතුවම් නිර්මාණ ආශ්‍රිත ව දැකිය හැකි ප්‍රධාන ලක්ෂණ
  - පාර්ශව දර්ශී රූප
  - තීරු චිත්‍ර සංරචන වල අඛණ්ඩ කථන ක්‍රමය
  - දිවි මාන ලක්ෂණ සහිත පැතලි වර්ණ භාවිතය
  - වර්ණ සඳහා කහ ,කොළ, රතු, කළු, සුදු ආදී වර්ණ භාවිතය
  - ප්‍රෙස්කෝ සිකෝ ශිල්ප ක්‍රමය
  - රූප වටා නිමාව දක්වන ප්‍රශස්ත මට්ටමින් යුතු සියුම් රේඛාකරණය
  - පසුබිම සඳහා ගුරු වර්ණය
  - පසුබිම අවකාශය පිරවීම සඳහා විවිධ සැරසිලි මෝස්තර භාවිතය
  - සමස්ත සංරචනය තුළ පරිමාණය හා පර්යාවලෝක රීති නොසැලකීම .



**ක්‍රියාකාරකම**

1. ටැම්පිට විහාර යනුවෙන් හඳුන්වන්නේ කුමක්ද?
2. මැදවල ටැම්පිට විහාරය පිහිටා ඇත්තේ කොහේද?
3. මේ සඳහා යොදාගෙන ඇති ගල් කණු ගණන කීයද ?ඒවායේ උස කොපමණද?
4. මැදවල විහාරය දක්නට ලැබෙන බිතුසිතුවම් කුමන සම්ප්‍රදායට අයත් වේ ද?
5. මැදවල විහාරයේ දක්නට ලැබෙන සිතුවම් කිහිපයක් ලියන්න.
6. මැදවල ටැම්පිට විහාරයේ සිතුවම් නිර්මාණ ආශ්‍රිතව දැකිය හැකි ප්‍රධාන ලක්ෂණ මොනවාද?

**පැවරුම.- මැදවල ටැම්පිට විහාරය සහ එහි දක්නට ලැබෙන සිතුවම් පිළිබඳ වැඩිදුර තොරතුරු එකතු කරන්න**